බන්ධ:කො:ජ: චක්‍ර ලේඛ අංකය: 39 /2014

මගේ අංකය: කේ.0/51/205/14,
බන්ධනාගාර මූලස්ථානය,
කොළඹ 09,
2014.10.01 වෙනි දින.

සියළුම බන්ධනාගාර අධිකාරින්,
සහකාර බන්ධනාගාර අධිකාරින් වෙත.

## 2015 වසරට ආගමික වතාවත් සිදුකිරීම සඳහා පූජකවරුන් පත්කිරීම

2014 වර්ෂය සඳහා සියළුම බන්ධනාගාර ආයතනවල රඳවා සිටින එක් එක් ආගමට අයත් සිර /සැකකරුවන් හට ආගමික කටයුතු සිදු කිරීම සඳහා වෙන් වෙන් වශයෙන් පත්කර ඇති පූජකවරුන්ගේ නිල කාලසීමාව 2014.12.31 වෙනි දිනෙන් අවසන් වන බැවින් . 2015 වර්ෂය සඳහාද නැවත එම කටයුතු සිදුකිරීමට අළුතින් පූජකවරුන් පත්කල යුතුව ඇත.

02. ඒ අනුව , පහත ආකෘති පත්‍රයේ සඳහන් ආකාරයට තොරතුරු ඇතුලත් පූජකවරුන්ගේ නාම ලේඛණයක් සකස්කර ඔබගේ නිර්දේශය සහිතව 2014.12.10 වෙනි දිනට පෙර මා වෙත එවිය යුතුය.

03. තවද , 2014 වර්ෂයේ නේවාසිකයින්ගේ ආගමික කටයුතු සිදුකිරීම සඳහා පත්කර ඇති පූජකවරුන් විසින් සමහර ආයතන වල නේවාසිකයින්ගේ ආගමික කටයුතු සිදුකිරීමේ මුවාවෙන් බන්ධනාගාර දෙපාර්තමේන්තුව හා ආයතන විවේචනය කරමින් මහජනයා මුලාවන පරිදි පුවත්පත් වලට හා වෙනත් මාධ්‍ය වලට අසත්‍ය තොරතුරු සපයමින් දෙපාර්තමේන්තුව අපකීර්තියට පත්වන අයුරින් කටයුතු සිදුකර ඇති බව මා වෙත වාර්තා වී ඇත. එබැවින් මේ සම්බන්ධයෙන් ඔබගේ විශේෂ අවධානය යොමුකර එවැනි ආගමික කටයුතු සිදුකරගෙන යාමට නුසුදුසු පූජකවරුන්ගේ නම් නිර්දේශ නොකිරීමට ඔබ විසින් වගබලා ගත යුතුය.

03. ඉහත පූජකවරුන් පත් කිරීම සඳහා තෝරා ගැනීමේදී මේ වන විට පත්කර ඇති පූජකවරුන් කොපමණ වාරයක් බන්ධනාගාරයට පැමිණ අදාල ආගමික කටයුතු සිදුකලාද , නැද්ද යන්න සහ ඒ අනුව ඔවුන්ගේ ආගමික මෙහෙවර තවදුරටත් බන්ධනාගාර නේවාසිකයින් හට ප්‍රයෝජනවත්ද යන්න ඇගයීමක් කොට අදාල පූජකවරුන්ගෙන් යම් අයෙකු හෝ කණ්ඩායමක් ආයතනයේ නේවාසිකයින් හට ක්‍රමවත්ව ආගමික කටයුතු සිදුකරගෙන යාමට නුසුදුසු වන බව හැගියයි නම් ඔවුන්ගේ නම් ඉවත් කිරීමට කටයුතු කර එම නම් ඉවත්කිරීමට හේතූන් මා වෙත වාර්තා කල යුතුය. මේ සඳහා අළුතින් පත්කරනු ලබන පූජකවරුන් වේ නම් ඔවුන් පත්කිරීමට හේතූන්ද සංක්ෂිප්තව සටහන් කර ඔබ ආයතනයේ දැනට රඳවා සිටින සිර /සැකකරුවන්ගේ සංඛ්‍යාවට හා ඔවුන් විසින් අදහන ආගමට සරිලන පරිදි පූජකවරුන් පත් කිරීමට අවශ්‍ය තොරතුරු සැපයීම ආයතන අධිකාරි /සහකාර අධිකාරි වරයාගේ වගකීමක් බව සඳහන් කරමි.

04. එල්.ටී.ටී.ඊ සිර /සැකකරුවන් රඳවා සිටින ආයතන වලට පත්කරන පූජකවරුන් වෙනුවෙන් ඔවුන් පදිංචි ප්‍රදේශයට අයත් පොලිස් වාර්තා ලබා ගැනීමෙන් පසුව තොරාගනු ලබන සුදුසු පූජකවරුන්ගේ නම් එම වාර්තා සමග මාවෙත යොමුකල යුතු අතර , 2014 වර්ෂයේ පත්කරන ලද පූජකවරුන්ගෙන් ඒ ඒ ආගමට අයත් ප්‍රධාන පූජකවරයා සමග සාකච්ඡා කර ගැනීමෙන් පසුව තෝරාගනු ලබන පූජකවරුන්ගේ නම් පමණක් නියමිත දිනට පෙර ඔබගේ නිර්දේශය සහිතව එවීමට කටයුතු කල යුතු බව වැඩිදුරටත් දන්වමි.

2015 වර්ෂය සඳහා පූජකවරුන් පත් කිරීම

.............................................. බන්ධනාගාරය

| බෞද්ධ | කතෝලික | ඉස්ලාම් | මෙතෝදිස්ත | හින්දු | වෙනත් ආගම් |
|---|---|---|---|---|---|
| | | | | | |

චන්ද්‍රරත්න පල්ලේගම
බන්ධනාගාර කොමසාරිස් ජනරාල්

බන් ... පල්ලේගම
... කොළඹ 09.